සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/

නිපුණතා මට්ටම : නියමිත තිත් රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි.

අරමුණු -

- කඩතුරා කවි යන්න විස්තර කරයි
- කඩතුරා කවි යන්න හඳුනාගනියි
- කඩතුරා කවි ගායනා කරයි
- කඩතුරා කවි තාල තබයි
- සහයෝගයෙන් කටයුතු කරයි
- දැනුම හා අත්දැකීම් අනෙක් අය හා හුවමාරු කර ගනී
- සතුටින් විවේකය ගත කරයි

ක්‍රියාකාරකම : **කඩතුරා කවි ගායනා කරමු.**

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ 9 ශ්‍රේණියෙ දී පළමු හා දෙවන වාරයේ දී ගායනා කරනලද ගායනා නැවත වරක් ගායනා කරන්න.

දෙවන පියවර : එම ගායනා සේම කඩතුරා කවිත් අපි ගායනා කල යුතුයි, ඊට පෙර මේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකිදැයි බලන්න.

1 - කඩතුරා ගායනා සිදුකරන්නේ කුමන කාර්යයේදිද ?
2 - කඩතුරා කවි ගායනා කරන්නේ කුමන හේතුවක් නිසා ද?
3 - කඩතුරා කවි වලින් පිළිබිඹුවන්නේ කුමන කරුණු පිළිබඳවද ?
4 - කඩතුරා කවි නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද ?
5 - කඩතුරා කවි තුළ දක්නට ඇති අන්තර්ගතයන් මොනවාද ?

තුන්වන පියවර : දැන් පහත කවි ඔබ ගායනා කිරිමට හැකිදැයි, උත්සාය කරන්න.

හතරවන පියවර : ගායනා කිරීමට නොහැකිනම් සිත් තැවුල් ඇතිකර නොගන්න ඔබට පාසැල් ගිය පසු ඉගෙන ගැනීමට හැකිය, ඒ නිසා මෙම කවි පාඩම් කරගන්න.

තාල රූපය ෘ-   මාත්‍රා 3 + 3 මැදුම් තනිතිත

කඩතුරා කවි, උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් තුනටම පොදු ගායනා විශේෂයක් ලෙස හඳුන්වා දිය හැකිය. කඩතුරා යනු ශාන්ති කර්ම වල දී සුදු පිරුවටයක් ලෙෂ රංග සැරසිල්ල ආවරණයට භාවිත කරන තාවකාලික ආවරණයයි. මෙම කවිවල බෞද්ධාගමික ලක්‍ෂණ ඇතුලත් වේ.

සිහින් සිනිඳු සළුව පැළඳ විත් උන්    මරඟන
වහන්ස නුඹ අප අතහැර මන්දමහන    උණ
අහංකාර ඒ මරඟන දැක්කා බුදු    ගුණ
මිහින්තලා ධාතුබෙලෙන් කඩතිර    හරිමින

ඈත එපිට දීපංකර මුණි විවරණ    ගන්නේ
මෑත කපේදී මතු බුදු වෙමැයි සිතා    ගන්නේ
භූත පිසා යක්‍ෂ දෝෂ බය දුක් දුරු    වන්නේ
ජේතවනාරාම බෙලෙන් කඩතිර හරි    මින්නේ

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | සි | හින් | සි | නි | ඳු | ස | ළු | ව | පැ | ළ | ඳ |
| + | විත් | උ | න් | ම | ර | ඟ | න | - | - | - | - |
| + | ව | හන් | ස | නු | ඹ | අ | ප | අ | ත | හැ | ර |
| + | මන් | ද | ම | හ | ණ | වු | ණ | - | - | - | - |

සහායක ඉගෙනුම් ආධාරක

- e නැණ පියස - Course: 9 ශ්‍රේණිය නර්තනය
- වෙනත් youtube නාලිකා
    - තාල රංග you tube නාලිකාව - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලය නර්තන අංශය
    -
- අතිරේක පොත්/ සඟරා - අත්රේක කියවීම් පොත 9 ශ්‍රේණිය නර්තනය